# පිළිතුරු

1. * බ්‍රිතාන්‍ය දේශපාලන ස්ථාවරත්වය
   ආර්ථික සංවර්ධනය සඳහා ව්‍යාපාරික කටයුතු වල යෙදීමට නිදහස ,උපකාරය හා බදු සහන ආදිය පාර්ලිමේන්තුව මගින් ලැබීම.

   *මුදල් ආයෝජනය කළ හැකි ධනවතුන් පිරිසක් සිටීම
   16 වන සියවසේ සිට යුරෝපයේ වෙළඳ හා වාණෙඳ හා වාණිජ කටයුතු දියුණු වූ අතර 18 වන ශත වර්ෂය ආරම්භ වන විට යුරෝපා රටවල් අතරින් පෘතුගාලය, ස්පාඤ්ඤය , ඕලන්දය , ප්‍රංශය වැනි රටවල් වලට වඩා එංගලන්තය ඉදිරියට පැමිණ තිබුණි . මෙම නිසා කර්මාන්ත සඳහා මුදල් ආයෝජනය කළ හැකි ධනවතුන් පිරිසක් එරට බිහි විය .

   *අමුද්‍රව්‍ය පහසුවෙන් ලබාගත හැකි වීම
   බ්‍රිතාන්‍ය තුළ ද කාර්මික නිෂ්පාදන වලට අවශ්‍ය ගල් අඟුරු වැනි අමුද්‍රව්‍ය බහුල ප්‍රදේශ, එයට උදාහරණ : දකුණු වේල්ස් , යෝක්ෂයර් හා ලැන්කැෂයර් එමෙන්ම බ්‍රිතාන්‍යයට අයිති යටත් විජිතවලින් ද අමුද්‍රව්‍ය පහසුවෙන් ලබා ගැනීමට හැකි විය. උදාහරණ : ඉන්දියාව වැනි රටවල්

2. පේෂ කර්මාන්තය - බ්‍රිතාන්‍ය රෙදිපිළි වලට යටත්විජිතවලින් ඉහළ ඉල්ලුමක් පැවති බැවින් රෙදිපිළි නිෂ්පාදනය ශීඝ්‍රයෙන් වර්ධනය කළ යුතු වීම නිසා.

   ගල් අඟුරු කර්මාන්තය - යපස් උණු කිරීම යන්ත්‍රසූත්‍ර ක්‍රියාකරවීම හා ගේදොර භාවිතය සඳහා ලාභදායී හා කාර්යක්ෂමව බලශක්තියක් ලෙස ගල් අඟුරු ජනප්‍රිය වීම.

   යකඩ හා වානේ - මහා පරිමාණයෙන් යන්ත්‍ර සූත්‍ර නිපදවීමට යකඩ හා වානේ අවශ්‍ය වීම නිසා .

3. * ගල් අඟුරු පිලිස්සීමෙන් ලැබෙන ගල්පර මහා මාර්ග ඉදිකිරීම සඳහා යොදා ගැනීම.
   *ගල් අගුරු මගින් රෙදිපිළි සායම් කිරීමට අවශ්‍ය සායම් වර්ග නිෂ්පාදනය
   *ඖෂධ, සුවඳ විලවුන් තෙල් හා හා පොහොර නිපදවීමට හැකිවීම

4. *ගල් අඟුරු කැණීමේදී ආකර වල එකතු වන ජලය ඉවත් කිරීම
   *ගැඹුරට කැණීමේදී ආකර පතුලේ විෂ වායු තිබීම
   *ආකර පතුලේ උෂ්ණත්වය වැඩිවීම
   *ආකර තුළට ආලෝකය සැපයීම